**තිරප්පනේ ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**----------------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ** විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 21 දින සභාපතිවරයා වෙත යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ** මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
--------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පුරනැගුම ව්‍යාපෘතියේ ප්‍රතිපාදන මත සහා භූමියේ ඉදිකරන ලද බහුකාර්ය ගොඩනැගිල්ලේ සමාලෝචිත වර්ෂය අවසානයට වියදම රු.42,505,310 ක් වුවත් එය මූල්‍ය ප්‍රකාශනවල රු.45,000,000 ක් ලෙස දැක්වීම හේතුවෙන් ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම රු.2,494,690 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) පුරනැගුම ව්‍යාපෘති ප්‍රතිපාදන වලින් ඉදිකර සභාවට පවරා දී තිබුණු සනීපාරක්ෂක මධ්‍යස්ථානයේ රු.3,199,398 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.5,000,000 ක් ලෙස දැක්වීම හේතුවෙන් ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම රු.1,800,602 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) පුරනැගුම ව්‍යාපෘතියෙන් සභාවට ලබාදී තිබුණු රු.3,593,985 ක් වටිනා ස්ථාවර වත්කම් ගිණුම්ගත නොකිරීම නිසා ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන ආදායමට දායකවීමේ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි වෙළඳසැල් හා කඩකුලී ගිණුමේ ශේෂය රු.1,437,135 ක් විය යුතු වුවත්, එම වටිනාකම රු.1,422,035 ක් ලෙස දැක්වීම හේතුවෙන් හිඟහිටි කුලී ගිණුමේ ශේෂය රු.15,100 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් රු.804,994 ක් වුවත් ආදායම් වියදම් ගිණුමේ එය රු.782,523 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම් රු.22,471 කින් අඩුවෙන් දැක්වුණි.

(ඊ) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂයේ නොවැම්බර් මාසයේදී සභාවට ලබාදී තිබුණු ගැල්වනයිස් බට 125 ක වටිනාකම වූ රු.138,393 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගතකර නොතිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්

ඉඩම් හා ගොඩනැගිලි උපලේඛනයේ ශේෂයන් සහ ලෙජර් ගිණුම් ශේෂයන් අතර රු.17,614,579 ක වෙනසක් පැවතුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙනඑමින් පවතින එකතුව රු.540,249 ක්වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 09 ක් සහ එකතුව රු.1,256,037 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 04 ක් සමාලෝචිත වර්ෂය තුළ නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණු අතර එම ශේෂයන්ගේ කාල විශ්ලේෂණයක් හා ශේෂ තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.122,654,261 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම

1.3.5.1 නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත | |
| | 177 වගන්තිය | සභාවේ සේවය කරන තාවකාලික අනියම් සේවකයන් වෙනුවෙන් පාරිතෝෂික ගෙවීම් සඳහා වූ යෝජනා ක්‍රමයක් පිහිටුවීම පිණිස අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | |
| (i) | රීති 5.11 | සභාව සතු මාර්ගස්ථ මුදල් සහ වෙනත් වටිනා භාණ්ඩ සම්බන්ධයෙන් රක්ෂණ ආවරණයක් ලබාගෙන නොතිබුණි. |
| (ii) | රීති 33 | වරිපනම් ගෙවීම් පැහැර හරින පුද්ගලයන් පිළිබඳව ලැයිස්තුවක් සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු එක් එක් කාර්තුව අවසානයේදී පිළියෙල කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | රීති 217 හා 218 | සභාව සතු ඉඩම හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ප්‍රා.ස. 46 ආකෘතිය ප්‍රකාර ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සභාව සතුව පවතින පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳව ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

2 මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.913,037 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.1,456,685 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය වටිනාකම | 2017 වර්ෂයේ බිල්කල ආදායම වටිනාකම | 2017 රැස්කළ ආදායම 2017.01.01 හිඟය වටිනාකම | 2017 රැස්කළ ආදායම 2017 බිල්කළ මුදලින් වටිනාකම | 2017 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම වටිනාකම |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 134,369 | 245,358 | 8,182 | 138,458 | 233,087 |
| කඩකුලී | 739,546 | 645,600 | - | - | - |
| | 68,730 | 75,330 | 66,937 | 40,233 | 1,422,035 |
| නල ළිං ගාස්තු | 369,300 | 42,800 | 36,800 | 9,200 | 366,100 |
| මස්කඩ | 182,917 | 847,400 | 500 | 847,400 | 182,416 |
| එකතුව | 1,494,862 | 1,856,488 | 112,419 | 1,035,291 | 2,203,638 |

සමාලෝචිත වර්ෂය ආරම්භයේ රු.1,494,862 ක්වූ මුළු හිඟහිටි ආදායමින් සියයට 7.5 ක් වූ රු.112,419 ක් පමණක් අයකරගෙන තිබුණි.

2.2.2 වරිපනම් හා බදු

-----------------

සමාලෝචිත වර්ෂයේ වරිපනම් හා බදු රු. 245,358 ක් බිල්කර තිබුණ නමුත් වර්ෂය අවසානයට බිල්කල ආදායමෙන් සියයට 94 කට සමාන රු.233,087 ක හිඟහිටි වරිපනම් පැවතුණි. එම හිඟ ශේෂ අයකර ගැනීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.2.3 කුලී

----

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි කඩකුලී රු.1,442,035 ක් වූ අතර 2018 ජූලි 20 දින වනවිට එයින් රු.420,295 ක් අයකර ගෙන තිබුණි. හිඟහිටි කුලිය රු.1,021,740 ක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 උසාවි දඩ

------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි උසාවි දඩ රු.618,476 ක් වූ අතර 2018 ජූලි 20 දින වනවිට එයින් රු.277,090 ක් ලැබී තිබුණි.

2.2.5 වෙනත් ආදායම්

-------------------

සභා බල ප්‍රදේශය තුළ පවතින සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති හෝටල් 02 කින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149(ඇ) වගන්තිය ප්‍රකාර ආදායම් වාර්තා ලබාගෙන වාර්ෂික පිරිවැටුම මත අයකරනු ලබන සියයට 1 ක බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්ය සාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-----------------

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තියේ සඳහන් කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය ප්‍රකාර අතුරු ව්‍යවස්ථා පනවා ඒවට අදාල බලතල ස්ථාපිත කර කටයුතු කලයුතු නමුත් ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවීම 2017 දෙසැම්බර් 31 දින වනවිටත් සිදුකර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

------------------

සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) පාරිසරික ගැටළු

--------------------

සභාව විසින් රැස්කරනු ලබන කසළ වලින් දිරාපත් නොවන ද්‍රව්‍ය පිළිසරු ව්‍යාපෘතිය අසල එළිමහන් භූමියේ බැහැරකර තිබුණි. වර්ෂා කාලයේදී එම අපද්‍රව්‍ය වලට ජලය එකතු වීමෙන් හා කැලි කසළ පරිසරයට නිරාවරණවය වීමෙන් සෞඛ්‍ය ගැටළු වලට මුහුණදීමට සිදුවියහැකි බව හා දිරාපත් නොවන ද්‍රව්‍ය පරිසරයට මුදාහැර දහනය කිරීමෙන් විෂවායු පිටවී පාරිසරික හානියක් සිදුවිය හැකි බව නිරීක්ෂණය විය.

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යායපත්‍රය පිළිබඳව සමාලෝචිත වර්ෂය තුළ සභාව දැනුවත් වී නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පුර නැගුම ව්‍යාපෘතියෙන් සභාවට පරිත්‍යාග ලෙස ලැබුණු රු.42,505,310 ක් වටිනා බහු කාර්යය ගොඩනැගිල්ල හා ශ්‍රවණාගාරය කුලියට දීම මගින් ආදායම් වර්ධනය කර ගැනීම සඳහා සභාවේ අවධානය යොමුවී නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුළ දුරකථන කුළුණු 11 ක් ස්ථාපිත කර තිබුණු නමුත් ඉන් කුළුණු 03 කට අදාලව පමණක් මූලික ගාස්තුව අයකර තිබුණි. මේ සම්බන්ධව 2009 සැප්තැම්බර් 17 දිනැති අංක 1597/08 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ දැක්වෙන පරිදි ගාස්තු අයකිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

-----------------------------

පහත කරුණු නිරීක්ෂණ විය.

(අ) සභාව විසින් නඩත්තු කරනු ලබන ඉඩම් 13 කට හා ගොඩනැගිලි 01 කට අදාලව පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 03 හි 03 ඡේදය පරිදි හිමිකම් ඔප්පු හා පිඹුරුපත් ලබා ගැනීමටත්, එම ඉඩම්වල මායිම් ලකුණු කිරීමටත් , ඒවායේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමටත් කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුළ සුසාන භූමි 54 ක් සඳහා ඉඩම් වෙන්කර තිබුණු නමුත් 2006 නොවැම්බර් 14 දිනැති PL/07/01/53 දරන පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 09 හි යෝජනා හා නිර්දේශ අංක 7.1 සිට 7.8 දක්වා ඇති කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව විසින් ප්‍රමුඛතාගත මාර්ග නඩත්තු ලැයිස්තුව පිළියෙළ කර නොතිබුණු අතර, පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 06 හි 03 වන ඡේදයේ දැක්වෙන යෝජනා නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
---------------------------------------

සභාව සතු වාහන 03 ක් ප්‍රයෝජනයට නොගෙන ගාල්කර තිබුණු අතර, ඒවා අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ, අළුත්වැඩියා කිරීමට නොහැකි නම් අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
------------------------------------------

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ පාලන කමිටුව විසින් අනුමත කරන ලද අයවැයගත සංඛ්‍යා හා තත්‍ය සංඛ්‍යා අතර සංසන්දනාත්මක ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය
----------------------

උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර තිබුණද, අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.3 විගණන හා කළමණාකරන කමිටු
--------------------------------------

2009 ජුනි 09 දිනැති DMA/2009 (i) කළමණාකරන විගණන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව 2017 වර්ෂය සඳහා විගණන හා කළමණාකරන කමිටු පිහිටුවා නොතිබුණි.

පද්ධති හා පාලනය
----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ආදායම් පාලනය | (i) ආදායම් ඇස්තමේන්තු සකස් නොකිරීම<br>(ii) ආදායම් නිලධාරීගේ වැඩ සුපරික්ෂණය නොකිරීම.<br>(iii) දේපළ තක්සේරු නොකිරීම. |
| (ආ) | සැලසුම් කිරීම | සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ස්ථාවර වත්කම් | (i) | ස්ථාවර වත්කම් නිසි පරිදි ගිණුම්ගත නොකිරීම. |
| | | (ii) | යාවත්කාලීනව සමීක්ෂණය නොකිරීම. |
| | | (iii) | වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම. |
| (ඇ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | | දිරාපත් නොවන ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට කටයුතු නොකිරීම. |
| (ඉ) | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | | දීර්ඝ කාලීනව පැවත එන ශේෂ හදුනාගෙන නිරවුල් නොකිරීම. |
| (ඊ) | අභ්‍යන්තර විගණනය | | අභ්‍යන්තර විගණනයක් සිදු නොකිරීම. |